# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2164/7 - 2020 පෙබරවාරි මස 24 වැනි සඳුදා - 2020.02.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 58

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, වෙළෙන්දකු හෝ සපයන්නකු විසින් පහත දක්වා ඇති අයිතමය එහි සඳහන් උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිළකට වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| ලොකු ළූණු (බී ළූණු) | කිලෝග්‍රෑම් 1ක් රු. 190.00 |

මෙම නියෝගය 2020 පෙබරවාරි මස 23 දින සිට බල පැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2016.07.14 වැනි දින අංක 1975/68 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග 39 හි සඳහන් 'බී ළූණු' යන අයිතමය මෙයින් ඉවත් කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**මේජර් ජනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2020 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

03 - 234

1A - PG 4890 — 217 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*